# ශ්‍රී ලංකාවඃ ඇත්ත දැනගැනීමට, යුක්තිය ඉටුකරවා ගැනීමට, සිදුවූ හානිවලට වන්දි ලබාගැනීමට, සිද්ධීන් නැවත සිදුවීම වළක්වා ගැනීමට තිබෙන අයිතිය

## එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිළිබඳ කවුන්සිලයේ 32 වැනි නිත්‍ය සැසිවාරය සඳහා ඉදිරිපත් කරන ලිඛිත ප්‍රකාශණය (13 ජුනි - 1 ජුලි 2016)[1]

2015 වසරේ ඔක්තෝබර් මාසයේදී පවත්වන ලද එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිළිබඳ කවුන්සිලයට ශ්‍රී ලංකාව තවත් රටවල් කීපයක් සමග හවුල්වී ***ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම සහ මානව අයිතීන් වැඩිදියුණු කිරීම*** නම් අංක 30/1 දරණ යෝජනාව ඉදිරිපත් කළාය.[2] සත්‍යය හෙළිදරව් කිරීම, යුක්තිය ඉටුකිරීම, සිදුවූ හානිවලට වන්දි ලබාදීම, මානව අයිතීන් කඩකිරීම්වලට භාජනයවූ උදවිය නැවත ඒවාට මුහුණදීම වළක්වාගැනීම, ජාත්‍යන්තර නීතිය යටතේ ගැනෙන වෙනත් අපරාධවලට වින්දිතයන් භාජනය නොකිරීම යනාදි පොරොන්දු සහිත බලාපොරොත්තුවලින් පිරිගත් න්‍යායපත්‍රයක් එම යෝජනාව තුළ වීය.[3] ඒ වාගේම, එම යෝජනාව මගින් ගැටුමට අදාළ මූලික අංග ආමන්ත්‍රණය කිරීම සඳහා කැපවීමෙන් යුතුව ක්‍රියාකරන බවට දුන් පොරොන්දු ගණනාවක්ද විය. බලාත්කාරයෙන් අතුරුදහන් කිරීම වැළැක්වීම එයින් ප්‍රධාන එකකි. ඉදින්, එම පොරොන්දු ඉටු කළ හැක්කේ පහත සඳහන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණවීමෙන් පමණිඃ බලාත්කාරයෙන් අතුරුදහන් කරවීමේ ක්‍රියාව මානවයාට එරෙහිව සිදුකරන මහා සාපරාධී ක්‍රියාවක් බව ප්‍රකාශයට පත්කිරීම, බලාත්කාරයෙන් පුද්ගලයන් අතුරුදහන් කරවීම නම් ක්‍රියාවෙන් පුද්ගලයන් ආරක්‍ෂා කරගන්නා එක්සත් ජාතීන්ගේ සම්මුතිය එකහෙළා පිළිගැනීම, අතුරුදහන්වූ පුද්ගලයින්ගේ පවුල්වලට සත්‍යය දැන ගැනීම සඳහා උදව්වන යාන්ත්‍රණ හා ක්‍රියාමාර්ග පිහිටුවීම, මෙතෙක් සිදුවූ ඒ සා අපරාධවලට යුක්තිය ඉටුකරවා දීම, වින්දිතයන්ගේ අඩපණවූ ජීවිත සහ යැපුම්මාර්ග නැවත ගොඩනගාගැනීම සඳහා උදව් කිරීම යනාදිය ඒ ක්‍රියාමාර්ග ලෙස හඳුන්වාදිය හැකිය. ශ්‍රී ලංකාවාසීන්ට ස්වකීය රට තුළ සමාජය තුළ ඉදිරියට යා හැක්කේ බලාත්කාරයෙන් අතුරුදහන් කරවීම නම් භාවිතාව මුලිනුපුටා දමා වින්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට සහන සලසාදීම සඳහා දරණ ප්‍රයත්න ඔස්සේ බව අවධාරණයෙන් කිව යුතුය.

ශ්‍රී ලංකාව තුළ, ආණ්ඩුවේ හමුදා සහ එල්ටීටීඊ හමුදා අතර, කාලයක් තිස්සේ දිග්ගැස්සෙමින් එකදිගටම සිද්ධවූ සන්නද්ධ ගැටුම 2009 වසරේදී අවසාන විය. මේ ගැටුම පැවති කාල පරිච්ඡේදය තුළ දෙපාර්ශ්වයම විසින් සිදුකරන ලද බරපතල අපචාර ක්‍රියාවලට ගොදුරු වූ වින්දිතයෝ තමන් වෙනුවෙන් යුක්තිය ඉටුවනු ඇතැ'යි සත්‍යය හෙළිදරව්වනු ඇතැ'යි නැවතත් සිදුවීම් සිදුනොවීමට ක්‍රියාත්මක ලෙසින්ම කටයුතු සිද්ධවනු ඇතැ'යි සිතමින් අදටත් කල්යවන්නාහ. සන්නද්ධ ගැටුම සිදුවූ කාලයේදීත් ඊට පෙරාතුවත් ඊට පසුවත් සිද්ධවූ සිද්ධීන් බොහොමයක් සම්බන්ධයෙන් මේවනතුරුත් සාධනීය විමර්ෂණ සිදුකොට නැත. වරද සිදුකළ උදවිය නීතිය ඉදිරියට මේවනතුරුත් පමුණුවා නැත. පොලිස් අත්අඩංගුවේ සිටින සැකකරුවන්ට වධහිංසා පැමිණවූ පුද්ගලයින් ගැන විමර්ෂණය කොට දඬුවම් පමුණුවනවා වෙනුවට එම පුද්ගලයන්ට දඬුවම් නොකිරීමේ හෙවත් මුක්තිය ලබාදීමේ තත්ත්වයක් උදාවී ඇත.[4]

සිරිසේන ආණ්ඩුව ප්‍රමුඛත්වය දී ඇත්තේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන හඳුන්වා දෙන්නටය. ඒවායේ ඉලක්කය වී ඇත්තේ අනාගතයේදී ආණ්ඩුබලය යොදා ගනිමින් නිල මට්ටමින් ඇතිවිය හැකි අපචාර ක්‍රියා වළක්වාලීමය. මේ ක්‍රියාදාමය සඳහා මහජන මතය විමසමින් ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ග මේ වනවිට පැසසුමට ලක්වී තිබේ. එහෙත් අතුරුදහන්වූ පුද්ගලයින්ගේ පවුල්වල උදවිය, ක්‍රියාධරයින් සහ වෙනත් සාමාන්‍ය ශ්‍රී ලාංකීය පුරවැසියන් පවසන්නේ ආණ්ඩුව ඉදිරිපත්කොට තිබෙන පුළුල් ප්‍රතිසංස්කරණ න්‍යායපත්‍රය තමනට අපැහැදිලි බවය. පරණගම කොමිසම[5] හමුවේ පෙනී සිටිමින් එකී පවුල් විසින් ගොනුකරන ලද සිද්ධිවාචක සාක්ෂි ආණ්ඩුවේ න්‍යායපත්‍රය විසින් ආමන්ත්‍රණය නොකරන බවය. උදාහරණයක් වශයෙන්, වින්දිතයන් බොහෝදෙනා අතුරුදහන්වීමට කලින් හමුදා කඳවුරුවල රඳවා සිටි බවට ඇසින් දුටු සාක්ෂි තිබීමේ කාරණාව දක්වත හැකිය. ඒ වාගේම, ආරක්‍ෂක හමුදා විසින් අත්පත් කරගෙන තිබෙන ඉඩම් නැවත පවරාදීම හෝ ඒ වෙනුවට වෙනත් ඉඩම් ලබාදීම හෝ මේවනතුරු සිදුනොවීමේ තිබීමේ කාරණාව ද දැක්විය හැකිය. ශ්‍රී ලංකාවේ යාපනය දිස්ත්‍රික්කයේ උතුරු වලිකාමම් ප්‍රදේශය තුළ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානයේ නියෝජිතයන් සිදුකළ සංචාරයකදී ඔවුනට දැකගන්නට ලැබුනේ අවතැන්වූ ජනයා තවමත් තාවකාලික ආවරණ තුළ ජීවත්වන අන්දමය. තමනට මේ තාක් කිසිදු ආධාරෝපකාරයක් නොලැබුණු බව ඔවුන් පවසා ඇත.

කඩකිරීම්වලට භාජනය කරන ලද ස්වකීය මානව අයිතීන් සම්බන්ධයෙන් ඉදිරිපත් කෙරෙන ඉල්ලීම්වලට ඇහුම්කන්දෙනු ඇතැ'යි බලාපොරොත්තුවෙන් අවුරුදු දශක ගණන් කල්ගෙවූ ශ්‍රී ලාංකික ජනයාගේ හොඳහිත ආණ්ඩුව පලුදු නොකළ යුතුය. ප්‍රතිසංස්කරණ සඳහා දරන ප්‍රයත්න හරහා ආණ්ඩුව සාමය, විනිවිදභාවය, විවෘතභාවය ඉහළ නැංවිය යුතුය. එකී ප්‍රයත්න සියළු ජනකොටස් සහභාගී කරවාගනිමින් සිදුකරන අවංක උත්සාහයන් බව ඒත්තු ගැන්විය යුතුය.

ස්වකීය පොරොන්දු ඉටුකිරීම සඳහා ආණ්ඩුවට ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය බව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් සංවිධානය තේරුම් ගනී. ඒ කොයිහැටිනුමුත්, ස්වකීය ප්‍රතිසංස්කරණීය ප්‍රයත්න බරපතල වගකීම්සහගත ඒවා බව ජනයාට ඒත්තු ගන්වා ඔවුන්ගේ විශ්වාසය දිනාගැනීම ආණ්ඩුවෙන් පැත්තෙන් කළ යුතු ඉතා වැදගත් කර්තව්‍යයක් වනු නොඅනුමානය.

ශ්‍රී ලංකාවේ ආණ්ඩුව පහත යෝජනා කර ඇති ආකාරයෙන් වැඩ පටන්ගත යුතු යැයි අපි කියා සිටිමු:

- ප්‍රමාණවත් තරම් මූල්‍ය සහ ප්‍රවාහන පහසුකම් කලට වේලාවට සපයමින්, සංක්‍රාන්තීය යුක්තිය පිලිබඳ යාන්ත්‍රණ සැලසුම් කිරීමේ අරමුණින්, මහජන අදහස් උදහස් ලබාගැනීම සඳහා කටයුතු සංවිධානය කිරීම; එම ක්‍රියාවලියේදී සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් සාධනීය පියවර ක්‍රියාවට නැංවීම.

යෝජිත සංක්‍රාන්තීය යුක්තිය ඉටුකිරීමේ යාන්ත්‍රණය අරබයා ප්‍රාදේශීය වශයෙන් උපදේශන ලබාගැනීමේ ක්‍රියාවලිය සංහිඳියා යාන්ත්‍රණ පිලිබඳ කාර්යසාධක බලකාය විසින් 2016 ජුනි මාසය වනතුරුම ආරම්භ කර තිබුනේ නැත. එම බලකාය විසින් මාර්තු මාසයේදී සිංහල, තමිල්, ඉංග්‍රීසි වෙබ් අඩවි ආරම්භ කර තිබුනත් අන්තර්ජාල පහසුකම් නැති උදවියට ඒවාට ප්‍රවේශ විය නොහැකිය. තවද, සත්‍යය හෙළිදරව්කරගැනීම සහ යුක්තිය සාධනය කරගැනීම සඳහා අවශ්‍ය ව්‍යුහයන්, ක්‍රියාවලීන්, පියවර යනාදිය ගොඩනගාගැනීම වෙනුවෙන් ලිඛිත යෝජනා ඉදිරිපත් කරන ලෙස අප්‍රේල් 5 දා කාර්යසාධක බලකාය ඉල්ලා සිටියාය; ඒ හැරෙන්නට, මානව අයිතීන් කඩ වූ අවස්ථාවලදී ඒවාට වගවීම සහතික කොට එම අවස්ථා යථා තත්ත්වයට පත් කිරීම වෙනුවෙන් යෝජනා ඉදිරිපත් කරන ලෙසත් ඉල්ලා සිටියාය.[6]

එහෙත්, අදාල සියළුම ලාංකීය පුරවැසියන් අතරේ උපදේශන ක්‍රියාවලිය දියත්කොට මහජන විශ්වාසය දිනාගැනීමේ සද්ක්‍රියාවට බාධා කැරෙන අන්දමේ දුර්වලතා ගණනාවකින් කාර්යසාධක බලකාය පෙළෙමින් සිටී. ප්‍රමාණවත් පරිද්දෙන් සම්පත් හා කාලය හිඟවීම ඒ අතරින් ප්‍රධානය. ඒවා සපුරාලීම සඳහා දැඩි හා ක්ෂණික අවධානය යොමු විය යුතුය. විශේෂයෙන්, වින්දිතයන් හා සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ කාර්යසාධක හා ස්වාධීන යාන්ත්‍රණ වහාම ක්‍රියාවට නැංවීම තුළින් ක්‍රියාවලිය ආරක්ෂා සහිතව පවත්වාගෙන යාමට පුළුවන්වනවා ඇත.

- මානව අයිතීන් සූක්ෂම ලෙස විභාග කිරීමේ කාර්යසාධක වැඩසටහනක් සංවිධානය කිරීම

බරපතල ලෙස මානව අයිතීන් කඩවුණු අවස්ථා පිලිබඳව සාක්ෂි ඇත්නම් ඒවාට අදාල නීතිය ක්‍රියාවේ යොදවන නිලධාරීන් සහ හමුදා නිලධාරීන් වහාම ඉවත්කොට ඔවුන්ගේ සේවය අත්හිටුවිය යුතුය.

- සියළුම පුද්ගලයන් බලාත්කාරයෙන් අතුරුදහන් කරවීම වලක්වා ඔවුන් ආරක්ෂා කරන ජාත්‍යන්තර සම්මුතිය ක්‍රියාවට නැංවීම

ආණ්ඩුව මෙම සම්මුතිය අත්සන් කර තිබෙන බැවින් එය සර්වප්‍රකාරයෙන් ක්‍රියාවට නැංවීම සහතික කළ යුතුය. එවිට දැනට ඉදිරිපත් කර තිබෙන විශ්වාසදායක පැමිණිලි දසදහස් සංඛ්‍යාව විසඳා අනාගතයේදී එවැනි දෑ සිදුවීම වලක්වා ගත හැකිය.[7]

- අතුරුදහන්වූ පුද්ගලයන් පිලිබඳව සොයාබැලීම සඳහා විනිවිදභාවයෙන් යුක්ත කාර්යසාධනීය කාර්යාලයක් පිහිටුවීම[8]

'අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක්' පිහිටුවීමටත් අතුරුදහන්වූ පුද්ගලයන්ගේ පවුල් වෙනුවෙන් මරණ සහතික නොව ප්‍රවාසි හෙවත් වාසය නොකරයි යන සහතික නිකුත් කිරීමේ සැලසුමටත් අමාත්‍ය මණ්ඩලය අනුමැතිය ලබා දී තිබේ. ඒ කෙසේවෙතත්, මේ ආරම්භක ක්‍රියා දෙකෙන් එකක්වත් තවමත් ක්‍රියාවට නංවා නැත. මේ කාර්යභාරයන් සැලසුම් කරන උපදේශන සාකච්ඡාවාරවලදී පවා ඊට නිසි අවධානය යොමුවුනේ නැතැ'යි වින්දිතයන්ගේ පවුල් චෝදනා කර සිටිති. ඒ වාගේම, විමර්ෂණවලදී එකතු කරගන්නා ලද තොරතුරු වෙනත් අපරාධ පිළිබඳ තොරතුරු සමග, සත්‍යය හෙළිදරව් කරගැනීමේ හා වන්දි ලබාදීමේ වෙනත් යාන්ත්‍රණ සමග, හවුලේ රඳවා තබාගෙන ඇතැ'යි ද ඔවුහු වාර්තා කළාහ. සත්‍යය හෙළිදරව් කරගැනීම, යුක්තිය ඉටුකරවාගැනීම, වන්දි ලබාදීම, සිද්ධීන් නැවත සිදුවීම වැළැක්වීම යන මහා කුළුණු හතර පිහිටුවාගැනීම සඳහා විනිවිදභාවයෙන් ඒ ඒ යාන්ත්‍රණ අතර තොරතුරු සාධනීය ලෙස හුවමාරුකරගැනීමත් අත්‍යවශ්‍ය බැව් නොකියා බැරිය. ඒ හැරෙන්නට, 'අතුරුදහන්වූ පුද්ගලයන්' වෙනුවෙන් මධ්‍යම දත්ත සමුදායක් පිහිටුවාලීමේ සැලසුම් ද අමාත්‍ය මණ්ඩලය ප්‍රකාශයට පත්කොට තිබේ.[9]

- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) වෙනුවට වෙනත් පනතක් හඳුන්වාදීම

ඉතා දරුණු ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (PTA) සංශෝධනය කිරීමට ශපථකොට ඇති නිසා, එම පනත ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල නොවන බව පිළිගත් නිසා, දැන් ආණ්ඩුව එම පනත නොපමාව ඉල්ලා අස්කරගෙන සැකකරුවන් එම පනත යටතේ අත්අඩංගුවට ගැනීමත් රඳවා තැබීමත් වහා නතර කළ යුතුය. මෙම පනත විසින් ලබා දී තිබෙන පුළුල් බලතල හේතුකොටගෙන පුද්ගලයින් දිගට හරහට අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමටත් ඔවුන්ව දිගුකාලයක් පුරා රඳවාගෙන වධහිංසා පැමිණවීමටත් අවසානයේදී ඔවුන්ව බලාත්කාරයෙන් අතුරුදහන් කරවීමටත් බලධාරීන්ට පුළුවන්කම ලැබී තිබේ. එපමණක් නොව පනත යටතේ අදහස් පළ කිරීමේ නිදහස ද සමාගම් පැවැත්වීමේ නිදහස ද අභිමත පරිදි ගමන්බිමන්යෑමේ නිදහස ද ඉතා දරුණු ලෙස සීමාකරන්නට පුළුවන. 2016 අප්‍රේල් මාසයේදී පමණක් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයින් 20 අත්අඩංගුවට ගැනීම සඳහා සිවිල් ඇඳුමින් සැරසී පැමිණි නිලධාරීන් ස්වකීය අනන්‍යතාවය පවා ඉදිරිපත් කළේ නැති බව අත්අඩංගුවේ සිටින පුද්ගලයන්ගේ පවුල්වල උදවිය ප්‍රකාශ කරති.

- අත්අඩංගුවට ගන්නා ලද පුද්ගලයින්ට වහාම නීතිඥ සහාය ලබාදීම, ප්‍රශ්න කරන කාලය තුළ එම සහාය දිගටම ලබා දී ඔවුන් අපයෝජනයට භාජනය කරවීම වලක්වාලීම

අපරාධ නඩු විධාන සංග්‍රහය සඳහා යෝජනා කර තිබෙන සංශෝධනය යටතේ පොලිස් කට උත්තර ගැනීමෙන් පසුව අත්අඩංගුවට පත්වූවන්ට නීතිඥ සහාය ලබාගැනීමේ අවකාශ තිබුණත් ඔවුන්ව අපහරණයට භාජනය කිරීම වළකාලන විධිවිධාන එහි නැත.

- මානව අයිතීන් කඩවීමට අදාල සංකේතාත්මක නඩුවිභාගවල ප්‍රගතිය ප්‍රසිද්ධියට පත්කිරීම

කොතෙකුත් පොරොන්දු දුන්නත් 2006 වසරේ ජනවාරියේදී ආරක්ෂක හමුදා විසින් නීතියෙන් බැහැරව ත්‍රිකුණාමලයේදී සිදුකරන ලද මනුෂ්‍ය ඝාතන වෙනුවෙන්, සිසුන් පස්දෙනෙකු ඝාතනය කිරීම සහ 2006 අගෝස්තුවේදී Action Centre La Faim සංවිධානයට අයත් සහන සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීම වෙනුවෙන්, වගකිවයුතු කිසිවකුට මේවනතුරුත් චෝදනා එල්ල කොට නැත. 2009 වසරේදී මානව අයිතීන් පිළිබඳ ක්‍රියාධරයෙකු වූ ස්ටීවන් සුන්දරරාජ් අත්අඩංගුවට ගෙන මුදාහළ සැණෙන් අතුරුදහන්වීම ද මේ වනතුරු විසඳා නැත. උතුරේ වාසය කරන බලාත්කාරයෙන් අතුරුදහන් කරවන ලද පුද්ගලයින්ගේ පවුල්වලට අයත් සිවිල් ජනතාව හමුදාව විසින් අපයෝජනය කරනුවාට එරෙහිව විරෝධතා පෙළපාලියක් සංවිධානය කළ දේශපාලන ක්‍රියාධරයින් දෙදෙනෙකු වූ ලලිත් වීරරාජ් සහ කුගන් මුරුගානාන්දන් 2011 වසරේදී අතුරුදහන් කරවීම සම්බන්ධයෙන් මෙතෙක් පරීක්ෂණ පවත්වා නැත. නිදහස් මතධාරී කාටූන ශිල්පියෙකු වූ ප්‍රගීත් එක්නැලිගොඩ 2010 දී අතුරුදහන් කරවීමෙන් පසු ඔහුගේ බිරිඳ සන්ධ්‍යා එක්නැලිගොඩ අදත් ආණ්ඩුවෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් කල් යවන්නීය. ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද හබයාස් කෝපුස් අයැදුමේදී ඔහුව හමුදා නිලධාරීන් විසින් රඳවාගෙන සිටින බවට සාක්ෂි ඉදිරිපත් විය. හමුදා බුද්ධි අංශයට අයත් නිලධාරීන් නමදෙනෙකුට එරෙහිව පරීක්ෂණ කෙරීගෙන යතත් එම පරීක්ෂණයේ ප්‍රගතිය

කඩාකප්පල් කරනු සඳහා නිරන්තර දේශපාලන උත්සාහයන් දැරෙන බව පැහැදිලිය.

- වහා ආධාරෝපකාර ලැබිය යුතු වින්දිතයන් සඳහා වන්දි ලබාදීමට අන්තර්වාර වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

රට පුරා විසිරී සිටින වින්දිතයනට සිදුවී තිබෙන හානි ගැන පූර්ණ තක්සේරුවක් කිරීම කල්ගතවන වැඩක් බැවින් වින්දිතයන් සමග අදහස් හුවමාරු කොට කඩිනම් වන්දි වැඩසටහනක් වර්ධනය කිරීමේ වැදගත්කම වහා පිළිගත යුතුය. වන්දි ලබාදීමේ වැඩසටහනක් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කිරීමට පෙරාතුව එලෙස බරපතල දුෂ්කරතාවලට මුහුණ දී සිටින වින්දිතයන් වහා හඳුනාගෙන ඔවුන් වෙනුවෙන් ඉක්මණින්ම වන්දි ලබාදීම වැදගත්ය. මෙම කඩිනම් වැඩසටහනට පුනරුත්ථාපනය, වන්දි ගෙවීම, ගැටුම් සිදු වූ කාලයේදී හමුදාව විසින් අල්ලාගන්නා ලද දේපොල සහ ඉඩම් මුල් අයිතිකරුවන්ට නැවත පවරාදීම යනාදිය ඇතුලත් විය යුතුය.

- අධිකරණයේ ස්වාධීනත්වය තහවුරු කිරීම සහ වධහිංසාවට එරෙහිව ගෙන යන අරගලය ශක්තිමත් කිරීම පිණිස අධිකරණ ස්වාධීනත්වය තහවුරු කරන සහ වධහිංසාවට එරෙහිව සටන් වදින එක්සත් ජාතීන්ගේ කාර්යාලයට අනුබද්ධ විශේෂ නියෝජිතයන්ගේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

යුක්තිය පසිඳලන ජාතික ක්‍රම පද්ධතිය ශක්තිමත් කිරීම සඳහාත් මුක්තිය ලැබීම හෙවත් වරදට දඬුවම් ලබානොදීම වලක්වාලීම සඳහාත් කාර්යසාධනීය අධිකරණ පටිපාටියක් ක්‍රියාත්මක කිරීම සහතික කළ යුතුය.

***මෙම අත්‍යවශ්‍ය ක්‍රියාවලිය සාර්ථක කරගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි සාමාජික රටවල් පහත සඳහන් ක්‍රියාමාර්ගවලට අවතීර්ණවෙමින් ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට සහාය දැක්විය යුතුයඃ***

- 2015 අවුරුද්දේදී මානව අයිතීන් පිළිබඳ කවුන්සිලයේදී සම්මත වූ යෝජනාව තුළ අඩංගු කර තිබෙන ක්‍රියාත්මක කළ යුතු කාරණා ක්‍රියාවේ යෙදවීම අරබයා, ඒවා පසුවිපරම් කරමින් ප්‍රගතිය වාර්තා කිරීම අරබයා, ශ්‍රී ලංකාවේ බලධාරීන් දිරිගැන්වීම.

- යුක්තිය ඉටුකරවාගැනීමේ, සත්‍යය හෙළිදරව් කරගැනීමේ, වන්දි ලබාගැනීමේ යාන්ත්‍රණවලට සහ සිද්ධීන් නැවත සිදුවීම වලක්වාලීමේ නෛතික ප්‍රතිසංස්කරණ යාන්ත්‍රණවලට තාක්‍ෂණික සහාය සහ මූල්‍ය ආධාර ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව පිරිනැමීම.

- මේ සියළු ආධාර පිරිනැමිය යුත්තේ සාර්ථක පිළියම් ලබාගැනීමට වින්දිතයන් සතු අයිතිය සාක්ෂාත් කිරීමේ වැදගත්කම අවධාරණය කරමින්ය. විශේෂයෙන්ම යුක්තිය, සත්‍යය, වන්දිය හමුවේ ස්ත්‍රීන්ට සාර්ථක ප්‍රතිචාර ලැබෙනවාද’යි යන්න අවධාරණයෙන් සොයාබලමින්ය; ඒ හැරෙන්නට, සිද්ධීන් නැවත සිදුවීම වලකාලන ක්‍රියාමාර්ග ගැනත් සොයාබැලිය යුතුය; ඒ සමගම, ස්ත්‍රීපුරුෂ සමාජභාවය සහ වෙනත් සමාජමය කාරණා සම්බන්ධයෙන් අඩුසැළකිලි දැක්වීම ක්‍රියාවට නැංවෙනවාද යන්නත් අවධාරණයෙන් සොයා බැලිය යුතුය.

- යෝජිත යාන්ත්‍රණ මගින් යුක්තිය, සත්‍යය, වන්දිය, සිදුවීම් නැවත සිදුනොවීම ක්‍රියාවෙන්ම සහතික කරනවාද’යි සොයාබැලීම සඳහා එම යාන්ත්‍රණ සමග සම්බන්ධීකරණය පවත්වාගෙන යා යුතුය, තොරතුරු හුවමාරු කරගත යුතුය.

- වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්වලට අනුකූලව ස්වාධීන හා සාධනීය යාන්ත්‍රණ පිහිටුවීම සඳහා ශ්‍රී ලංකාවේ බලධාරීන්ට උපකාර කළ යුතුය.

- සත්‍යය හෙළිදරව් කිරීමේ, යුක්තිය ඉටුකරවා ගැනීමේ, වන්දි ලබාගැනීමේ යාන්ත්‍රණ සමග සම්බන්ධ වී කටයුතු කිරීම නිසා කිසියම් බරපතල අවදානම් තත්ත්වයනට මුහුණදෙන වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට ස්වකීය රටවල ආරක්‍ෂා සහිතව ජීවත්වීමට ඉඩකඩ ලබාදෙනු සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සමග එක්සත් ජාතීන්ගේ සාමාජික රටවල් ගිවිසුමකට එළැඹිය යුතුය.

- රට තුළ සිදුවන කටයුතු හරියාකාරව නිත්‍යනුකූල අයුරින් සිදු කිරීම සඳහා නීතිය ක්‍රියාවේ යොදවන ඒජන්සිවලට අයත් නිලධාරීන්ට සහ හමුදා නිලධාරීන්ට මානව අයිතීන් රැකගැනීමේ වැදගත්කම ගැඹුරින් කියාදීමේ වැඩසටහන් රාශියක් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කළ යුතුය. එලෙස ගැඹුරු වැඩසටහන්වලට සහභාගීවූ නිලධාරීන් එක්සත් ජාතීන්ගේ සාමසාධක හමුදා සේවය සඳහාත් පුහුණු හා හුවමාරු වැඩසටහන් සඳහාත් සහභාගී කරවිය යුතුය.

- ජාත්‍යන්තර නීතිය හෝ වෙනත් මානව අයිතීන් රකින නීති හෝ කඩකළා යැයි සැක කරන පුද්ගලයින් ශ්‍රී ලාංකීය හෝ දෙමුහුන් හෝ අධිකරණය ඉදිරියට පමුණුවා ඔවුන්ට සාධාරණ යුක්තිසහගත අධිකරණ ක්‍රියාමාර්ගයක් ඔස්සේ මරණීය දණ්ඩනය නොවන දඬුවම් ලබාදීමේ ක්‍රියාදාමය සඳහා ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහයෝගය දක්විය යුතුය, නෛතික ආධාර සැපයිය යුතුය.

- මානව අයිතීන් පිලිබඳව සොයාබලන එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් කාර්යාලයක් ශ්‍රී ලංකාවේ පිහිටුවීමට සහයෝගය දිය යුතුය.

සටහන්

1. එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් කවුන්සිලයට ඉදිරිපත් කළ ලේඛණයට ඇමිණුම් ගණනාවක්ම ඇතුලත් කොට තිබේ. ඉඩකඩ සීමාවන් නිසා ඒවා මෙහි දක්නට නැත.

2. Promoting reconciliation, accountablility and human rights in Sri Lanka. A/HRC/RES/30/1, 14 October 2015, para 4.

3. මේ විස්තර සපයාගන්නා ලද්දේ එක්සත් ජාතීන්ගේ මානව අයිතීන් පිලිබඳ මහකොමසාරිස් කාර්යාලය විසින් ශ්‍රී ලංකාව පිලිබඳව සකස් කරන ලද වාර්තාවෙනි. නිර්දේශය 20, 251 පිටුව, 16 සැප්තැම්බර් 2015. A/HRC/30/CRP 2. http://un.lk/news/zeid-urges-creation-of-hybrid-special-court-in-sri-lanka-as-un-report-confirms-patterns-of-grave-violations/

4. වධහිංසාව සහ වෙනත් කෲර අමානුෂික අවමන්සහගත සැළකිලි සහ දඬුවම් සම්බන්ධ කටයුතු සොයාබලන එක්සත් ජාතීන්ගේ විශේෂිත නියෝජිත හුවාන් ඊ මෙන්ඩෙස් විසින් සිදුකළ නිරීක්‍ෂණ සහ නිර්දේශ, කොළඹ, 7 මැයි 2016, පිටුව 3.

5. එහි නිල නාමය ‘පැහැරගෙනයාම් සහ අතුරුදහන්කරවීම් ගැන විමර්ෂණය කිරීමේ ජනාධිපති කොමිසම’ යන්නයි. හිටපු ජනාධිපති මහින්ද රාජපක්‍ෂ සහ වර්තමාන ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන එහි විමර්ෂණ කාලය දිගුකරනු ලැබීය. 1991 වසරේ පටන් වාර්තා කැරුණු අතුරුදහන්වූ පුද්ගලයින් ගැන විමර්ෂණය කොට වාර්තාවක් සකස් කිරීමට ඊට බලය පවරනු ලැබීය. එහෙත් උගත්පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමට (LLRC) තරම් පුළුල් බලතල ඊට තිබුනේ නැත.

6. Secretariat for Coordinating Reconciliation Mechanisms, http://www.scrm.gov.lk/#!consultations/cjg9 යෝජනා ඉදිරිපත් කිරීම සඳහා මේ කාර්යාංශය ඉඩකඩ ලබාදුන්නේ මාසයකටත් අඩු කාලයකි. පසුව එය ජුනි 25 දක්වා දීර්ඝ කරනු ලැබීය.

7. 2015 වසරේදී ස්වකීය අවසාන වාර්තාව නිකුත් කළ, බලාත්කාරයෙන් පැහැරගෙනගොස් අතුරුදහන් කළ පුද්ගලයන් ගැන සොයාබැලීමේ සමස්ත ලංකා කොමිසමට ඒ වනවිට පැමිණිලි 10,136 සහ ඒවා සිදුකළ බවට සැකකරන පුද්ගලයින් 318 දෙනෙකු පිලිබඳ තොරතුරු ද ලැබී තිබිණ.

8. මෙම කාර්යාලයේ නම වෙනස් කරන්නැ’යි වින්දිතයන්ගේ පවුල්වල උදවිය සහ ක්‍රියාධරයින් ඉල්ලා සිටියේ එතුළ බලාත්කාරයෙන් අතුරුදහන් කරවීම පිලිබඳ අර්ථයක් නොකියැවෙන නිසාය. බලන්න, 'Open Letter to President Sirisena on Proposed Missing Persons Office', Sri Lanka Brief, 9 May 2016, http://srilankabrief.org/2016/05/open-letter-to-president-sirisena-on-proposed-missing-persons-office/

9. 'Decisions taken by the Cabinet of Ministers at its meeting held on 24-05- 2016,' Decision 15, http://www.news.lk/cabinet-decusions/item/13413-decisions-taken-by-the-cabinet-of-ministers-at-its-meeting-held-on-24-05-2016